# උඟුරාකන්ද ගුහා සටහන් පිළිබඳ විමර්ශනයක්

**ජයම්පත් සේනානායක[1], උමංගා රොෂාණි රම්මුංගොඩ**

ශ්‍රී ලංකාවේ ප්‍රාථමික ලෙන් චිත්‍ර ප්‍රධාන කොටස් දෙකක් යටතේ හඳුනාගත හැකිය. එනම් වර්ණ චිත්‍ර *(Pictographs)* හා ගල මතුපිට සීරුම් කළ සටහන් *(Petroglyphs)* වශයෙන් ය. මෙම ප්‍රාථමික සීරුම් සටහන් සහිත ස්ථාන 8 කට ආසන්න ප්‍රමාණයක් දැනට දිවයිනෙහි හඳුනාගෙන ඇති මුත් එම සටහන් කුමන යුගයක් හෝ සංස්කෘතියක් නිරූපණය කරන්නේද යන්න නිශ්චිතව හඳුනාගෙන නොමැත.එහෙත් මෙම ස්ථාන අතරින් දොරවක් කන්ද හා හබ්බෙලි කන්ද යන ස්ථාන දෙකෙහි සිදු කර ඇති පුරාවිද්‍යාත්මක පර්යේෂණ අනුව එම ස්ථානවලින් ප්‍රාග්ඓතිහාසික යුගයට අයත් සාධක හමු වී ඇත. දොරවක් කන්ද ස්ථානය ශ්‍රී ලංකාවේ නියොලිතික යුගය නියෝජනය කරන බවට පර්යේෂකයන්ගේ අදහසයි. එසේ වුවත් ඒ පිළිබඳ නිශ්චිත අදහසකට පැමිණ නැත. මෙම ස්ථාන ද්විත්වය පිහිටා ඇත්තේ මා ඔය නිම්නයේ වීම විශේෂත්වයකි. මෙයට තවත් සුවිශේෂිත්වයක් එක් කරන සාධකයක් ලෙස අස්මඩලාගල, උඟුරාකන්ද ප්‍රාථමික සීරුම් සටහන් දැක්විය හැකිය.

මාවනැල්ල ප්‍රදේශීය ලේකම් කොට්ඨාසයේ, අස්මඩලාගල ගම්මානයෙහි උඟුරාකන්ද පාමුල කුඩා ලෙන් පියස්සක් තුළ පිහිටි මෙම සීරුම් සටහන් ප්‍රාථමික ලක්ෂණ පෙන්නුම් කරයි. 1982 දී ඩබ්. ඒ. විජේපාල විසින් සොයා ගත් මෙම ස්ථානයෙහි දොරවක් කන්ද හා හබ්බෙලි කන්ද යන ස්ථාන ද්විත්වයේ වූ සීරුම් සටහන්වලට මූලික වශයෙන් සමානත්වයක් ගනී. ඉන් සංකේත වශයෙන් වඩාත් සමීප වන්නේ හබ්බෙලිකන්ද සීරුම් සටහන්වලටය. විශේෂයෙන් යම් තියුණු මෙවලමක් භාවිත කරමින් ගල මතුපිට සීරීමෙන් මෙම සටහන් නිර්මාණය කර ඇත. ප්‍රධාන වශයෙන් සරල රේඛා මගින් නිර්මාණය කර ඇති මෙම සටහන් වල ස්වභාවිකත්වයට වඩා සංකේතාර්ථයක් ගෙන දෙන බව පැහැදිලි වේ.

විශේෂයෙන් මෙම ප්‍රාථමික සීරුම් සටහන් පිහිටි ස්ථානය හා ඒ අවට උඟුරාකන්ද පුරා විවිධ ප්‍රමාණයන්ගෙන් යුත් ගල් ලෙන් හා ගල් පියසි දක්නට ලැබේ. විශේෂයෙන් මෙම ගල් ලෙන් ආශ්‍රිතව

[1] Dep. of Archaeology, University of Kelaniya
Email: jsenanayaka@gmail.com

ප්‍රාග් ඓතිහාසික මානවයා ජීවත් වූ බවට සාධක හඳුනාගත හැකිය. එමෙන්ම මෙම ස්ථානයට සමීපව මූල ඓතිහාසික යුගයට අයත් සුසාන, පර්යේෂණ මගින් සොයාගෙන ඇත. මෙම ස්ථානයෙන් හමුවන සීරුම් සටහන්, බොහෝ දුරට ශ්‍රී ලංකාවේ මූලඓතිහාසික යුගයට අයත් සුසානවලින් හමු වූ මැටි භාජනවල දක්නට ලැබෙන සංකේතවලට සමානත්වයක් ගනී. මේ අනුව ඌරාකන්ද ස්ථානයේ පිහිටීම හා හමු වන සංකේත පිළිබඳ පුරාවිද්‍යාත්මක විමර්ශනයක යෙදීම මෙම පර්යේෂණ පත්‍රිකාව මගින් බලාපොරොත්තු වේ.

ප්‍රමුඛ පද: ඌරාකන්ද, ප්‍රාථමික සීරුම් සටහන් ගුහා සිතුවම්

**Title:** An Investigation into the Pictographs and Petroglyps of Urakanda Cave

**Keywords:** Urakanda, Petroglyphs, Rock art